## මෙල්බර්න් පුරයේ රැව් නගන

# ''රෝමාන්තික ඔපෙරාව''

''ශ්‍රී ලංකාවේ තාරුණ්‍යයේ ගායකයා''- වරක් විදග්ධ සංගීත විචාරකයෙකු කසුන්ව හඳුන්වා දී තිබුණේ එසේයි. කසුන් කල්හාර ජයවර්ධන නම් වන මේ අපූර්ව ප්‍රතිභාපූර්ණ යෞවනයා, ''ශ්‍රී ලංකාවේ තාරුණ්‍යයේ ගායකයා'' පමණක් නොව ''තාරුණ්‍යයේ සංගීතඥයා'' ද වන බව මා පැවසුවහොත් පෙර කී වියත් විචාරකයා මා සමග එකඟ වනු ඇති බවට සැකයක් නැහැ. ශ්‍රාවකයාගේ හදවත සසල කළ හැකි හැඟීම්බරිත සුමධුර කටහඬකුත්, ඒ හඬින් අපරිමිත මාධූර්යයෙන් යුතුව ගයන්නට හැකි ගායන හැකියාවකුත්, ස්වර රටා නන් අයුරින් වියමින් සංගීත සංයෝජනය කිරීමේ හසල සුරුකමත් එකම කලාකරුවෙකු තුළ පිහිටීම විරල උරුමයකි. තවමත් හද්‍ර යෞවනයේ පසුවන මේ තරුණයා, ඒ විරල උරුමය දායාද ලෙස ලැබූවෙකි. බහ තෝරන වියේ සිටම සංගීත ස්වර ඇසුරේ හැදී වැඩුණු කසුන්, ගායකයෙකු සහ සංගීතඥයෙකු වශයෙන් අද වන විට ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයට කර ඇති සාධනීය දායකත්වය ප්‍රශංසනීයය.

කසුන් කල්හාර සිය අලුත්ම නිර්මාණ ඇතුළත් ගීත ඇල්බමය පසුගිය නොවැම්බර් මසදී රසිකයින් වෙත ඉදිරිපත් කළේය. ඔහු ඒ ගීත සමුච්චයට දී තිබූ නම ''රෝමාන්තික ඔපෙරාව'' යි. ''රෝමාන්තික ඔපෙරාව'' කසුන්ගෙ තුන්වන ගීත ඇල්බමයයි. මේ අලුත්ම ගීත එතකුව නිකුත්වීම නිමිතිකොට ගෙන ''රෝමාන්තික ඔපෙරාව'' නමින් සංගීත ප්‍රසංගයක් ද ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී 2008 නොවැම්බර් 30 වනදා පැවැත්විණ. කැන්ගරුදේශයේ වෙසෙන ශ්‍රී ලාංකේය සංගීත රසවතුන් වෙනුවෙන් ''රෝමාන්තික ඔපෙරාව'' රැගෙන මෙල්බර්න් නුවරට පැමිණෙන්නට කසුන් සහ ඔහුගේ වාදන ශිල්පී කැළ දැන් සූදානමින් සිටිති. ''ස්වෝන් එන්ටර්ටේන්මන්ට්ස්'' වෙතින් මෙල්බර්න් නගරයේ සංගීතලෝලී ලාංකික සහෘදයන් වෙත පිරිනැමෙන ''රෝමාන්තික ඔපෙරාව'' සංගීත ප්‍රසංග ය සොඳුරු සෞන්දර්යාත්මක සංගීත සන්ධ්‍යාවක් විඳගන්නට ඔබ සැම වෙත කෙරෙන ආරාධනාවකි. මාර්තු මස 14 වන දින බීසන් සෙන්ටර් සවන්හලේදී කසුන් සහ ඔහුගේ සංගීත සඟයා වන ඉන්ද්‍රචාප ලියනගේ ''රෝමාන්තික ඔපෙරාව'' ඔබ වෙනුවෙන් ඉදිරිපත් කරනු ඇත.

''මම නිර්මාණ කරන්නේ මා වෙනුවෙන්මයි. මගේ නිර්මාණයකින් මුලින්ම වින්දනයක් ලැබිය යුත්තේ මමයි......ඒ නිසා මට ආසාවෙන් නැවත නැවත අසා විඳින්නට බැරි නිර්මාණ මම මොනම හේතුවක් නිසාවත් රසිකයින්ට පිරිනමන්නේ නැහැ. ඒ වගේම මට අති මහත් වින්දනයක් ගෙන දෙන, ලංකාවේ සංගීත ලෝලීන්ට එතරම් හුරු පුරුදු නැති ඇතැම් සංගීත ශෛලීන්, ගායන විධි, ඔවුන්ට අසන්නට සලස්වන්න මම කැමතියි. මා තුළ දැඩි විශ්වාසයක් තිබෙනවා, සුන්දරත්වය ඉතිරි කොට ගෙන නිමැයෙන ඕනෑම නිර්මාණයක් සැබෑ සංවේදන ශක්තියක් තිබෙන රසිකයින් විසින් වැළඳ ගනීවි කියා. ඒ නිසාම මම නිරන්තරයෙන්ම නොයෙකුත් අත්හදා බැලීම් කරමින්, සංගීත ලෝලීන්ගේ වින්දන ශක්තිය පුළුල් කළ හැකි, ආකාරයේ විවිධ හැඩතල ගන්නා නිර්මාණ ඉදිරිපත් කරන්නට උත්සහ කරනවා.....මේ අලුත්ම ඇල්බම් එකේ තියෙන්නෙ ඒ වගේ අත්හදා බැලීම් එකතුවක්....මට අවශ්‍ය රසිකයින්ගේ රසාස්වාදන ශක්තිය පුළුල් කරන්න...මේ නිසාම සරල ගීත ආකෘතියෙන් ඔබ්බට ගිය, නිර්මාණ තමයි මේ එකතුවේ වැඩිපුර තියෙන්නෙ''

ඒ කසුන් කල්හාර තමන්ගේ අලුත් ගීත ඇල්බමය පිළිබඳව දක්වන අදහසයි. කසුන් සංගීත ක්ෂේත්‍රයට පිවිසෙන්නේම එක්තරා විදියක පෙරළිකාර ඇරඹුමකින්. ඉන්ද්‍රචාප ලියනගේ සමග කසුන් ඉදිරිපත් කළ ''අනන්තයට යන පාර දිගේ'' ගීතය මීට වසර පහ හයකට ඉහතදී ශ්‍රී ලාංකික සංගීත ලෝලීන් විසින් අතිමහත් උන්මාදයකින් යුතුව වැළඳ ගනු ලැබුවා. කසුන් විසින් සංගීතය නිර්මාණය කොට ඉන්ද්‍රචාප සමග ගැයූ ඒ ගීතය ලංකාවේ සංගිත ක්ෂේත්‍රයට පෙරළිකාර, ප්‍රතිභාපූර්ණ තරුණයෙකුගේ ආගමනය සනිටුහන් කළා. එතැන් පටන් දිනෙන් දින ගොඩ නැගෙන ජනාදරයට පාත්‍ර වූ කසුන් කල්හාර, හුදෙක් එකම ආරක සරල ගී රොත්තක් තම රසිකයින්ට පිරි නමනු වෙනුවට නව පර්යේෂණ කරමින්, විවිධ ගායන විධි, ආගන්තුක සංගීත සංයෝජන රටාවන් සංගීත ක්ෂේත්‍රයට හඳුන්වා දෙන්නට උත්සහ ගත්තා. ''රෝමාන්තික ඔපෙරාව'' ඒ ගමනේ එක් සංධිස්ථානයක් ලෙස හැඳින්විය හැකියි.

ගායනයේදි හැඟීමට මුල්තැන දිය යුතු බව අදහන කසුන්, සංගීතයත්, ගීත රචනාවත්, ගායන විධියත්, අසන්නාගේ හදවත හැඟීම්වලින් ආකූල කළ හැකි අයුරින් නිමැවිය යුතු බව අවධාරනය කරනවා. කසුන්ගේ ගායනාවන් තරුණ පරපුරට පමණක් ආසක්ත කරගත හැකි ලෙස සීමා නොවී විවිධ වයස්තලවල සිටින සියලුම රසිකයින්ට ආස්වාදනීය වන්නේ මේ හේතුව නිසාම විය හැකියි. '' මම හැමතිස්සෙම feeling එක ගැනයි mood එක ගැනයි හුගාක් සැලකිලිමත් වෙනවා. Feeling එකක් නැත්තං කොයිතරම් දක්ෂ විදියට, ස්වර වල කොයිතරම් නිවැරදිව පිහිටා ගායනා කළත් වැඩන් නැහැ. feeling එක තමයි මිනිස්සුන්ගෙ හදවතට වදින්නෙ'' ඒ කසුන් නිතරම තමන්ගේ සංගීත භාවිතාව පිළිබඳව මාධ්‍යයට කරන ප්‍රකාශයක්.

''වර්තමාන ලංකාවේ අපට ඇහෙන Music වල Mood songs ඇහෙන්නෙ නැති තරම්. 70 දශකයේ නම් ප්‍රේමසිරි කේමදාස, ඩබ්. ඩී අමරදේව, වික්ටර් රත්නායක සහ පසුකාලීනව අමරසිරි පීරිස් වගේ අයගෙන් එවැනි soft ලයාන්විත ගීත ඇහුණා. මගේ මේ Album එකේ ප්‍රධාන අරමුණුවලින් එකක්, එදදා දබට් ටිකක් වැඩිපුර ඇහෙන්න සලස්වන එක. මිනිස්සු තවමත් සංවේදීද, තාමත් ඒවා accept කරනවද කියන කාරණය මේකෙන් බලාගන්න පුළුවන්.''

රෝමාන්තික ඔපෙරාව සී ඩී තැටියේ කවරයේ සඳහන් වෙන සටහනකි ඒ. මේ ඇල්බමයටත් රෝමාන්තික ඔපෙරාව සංගීත ප්‍රසංගයටත් එය ට වඩා පැහැදිලි ටීකාවක් තවත් කොයිද?

මාර්තු 14 වන දා මෙල්බර්න් නුවර පැවැත්වෙන රෝමාන්තික ඔපෙරාව ප්‍රසංගයේදී කසුන් සහ ඉන්ද්‍රචාප ලියනගේ ගී ගයනු ඇති. ඉන්ද්‍රචාප කසුන් පරිදිම අද ලංකාවේ සිටින ප්‍රතිභාපූර්ණ තරුණ ගායකයෙක්. කසුන්ගේ සංගීත චාරිකාව ඇරඹෙන්නේ ද ඉන්ද්‍රචාප සමගින්. ඉන්ද්‍රචාප වර්තමානයේ ලංකාවේ රොක් සංගීත මාදිලියෙන් ගී ගයන, එම සංගීත ශෛලිය ජනප්‍රිය කරවීම වෙනුවෙන් පර්යේෂණාත්මක නිර්මාණ කරමින් සිටින යොවුන් ශිල්පියෙක්. මෙල්බර්න් නුවරදී ඔහු කසුන් සමග මෙන්ම තමන්ගේම වූ ගීත ගණනාවක්ද ගයනු ඇති.

රෝමාන්තික ඔපෙරාව ප්‍රසංගයේ වාද්‍ය වෘන්දය සමන්විත වන්නේ දක්ෂ යොවුන් වාදන ශල්පීන් පෙළකගෙ න්. බේස් ගිටාරය වයන නදීක ජයවර්ධන, අපූරු වාදන ශිල්පියෙකු මතු නොව විරල ගණයේ කටහඬකට උරුම කම් පාන ගායකයෙකු ද සංගීත නිර්මාපකයෙකු ද වෙයි. රොමේන් මෙන්ඩිස්, පියානෝ වාදකයෙකු ලෙස රෝමාන්තික ඔපෙරාව ප්‍රසංග යට දායක වෙයි. ඒ වතුදු රොමේන්ද අපූරු සංගීත සංයෝජකයෙක් වෙයි. කසුන්ගේ අලුත්ම ඇල්බමයේ ඔහ විසින් ගීත රචනා කොට සංගීතය නිර්මාණය කළ ගීත දෙකක් ඇතුළත් වෙයි. කසුන්ගේ මීට පෙර නිකුත් කළ ''හරිත නිම්නයේ'' සී ඩී පටයටත්, ''රැඩිකල් ප්‍රේමය'' සී ඩී පටයටත් රොමේන් ගීත නිර්මාණය කර තිබේ. පර්කෂන් වාදනයෙන් එක්වන රබිත රුවන් වික්‍රමරත්න, ඉතා කුඩා වියේදීම වෘත්තීය වාදන ශිල්පියෙකුගේ ශක්‍යතාවන් ප්‍රකට කළ යෞවනයෙකි. ඔහු අද ලංකාවේ සිටින ප්‍රතිභාසම්පන්න වාදන ශිල්පීන් අතලොස්ස අතරේ ඉදිරියෙන්ම සිටින්නෙකි.

මේ දක්ෂයන් සියලු දෙනා සමගින්, රෝමාන්තික සන්ධ්‍යාවක මිහිර විඳගන්නට මාර්තු මස 14 වන දින මෙල්බර්න් පුර වැසි ලාංකික අපට අවස්ථාව උදා වනු ඇත.

මාධූර්යයයෙන් පිරිපුන් හෝරා කිහිපයක සමාධිගත වෙන්නට ඇවැසි නම්, අපි ''රෝමාන්තික ඔපෙරාව'' සමගින් කසුන්, ඉන්ද්‍රචාප, නදික, රොමේන් සහ රබිත රුවන් නිමවන සෞන්දර්යය සමග ඒකාත්මික වෙමු.



**මම නිර්මාණ කරන්නේ මා වෙනුවෙන්මයි. මගේ නිර්මාණයකින් මුලින්ම වින්දනයක් ලැබිය යුත්තේ මමයි......ඒ නිසා මට ආසාවෙන් නැවත නැවත අසා විඳින්නට බැරි නිර්මාණ මම මොනම හේතුවක් නිසාවත් රසිකයින්ට පිරිනමන්නේ නැහැ. ඒ වගේම මට අති මහත් වින්දනයක් ගෙන දෙන, ලංකාවේ සංගීත ලෝලීන්ට එතරම් හුරු පුරුදු නැති ඇතැම් සංගීත ශෛලීන්, ගායන විධි, ඔවුන්ට අසන්නට සලස්වන්න මම කැමතියි. මා තුළ දැඩි විශ්වාසයක් තිබෙනවා, සුන්දරත්වය ඉතිරි කොට ගෙන නිමැයෙන ඕනෑම නිර්මාණයක් සැබෑ සංවේදන ශක්තියක් තිබෙන රසිකයින් විසින් වැළඳ ගනීවි කියා.**